රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 01/2014

මගේ අංකය :- EST-2/POLCY/03/0798-I
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2014.01.21

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

රාජ්‍ය නිලධරයන් විසින් අත් කර ගත යුතු රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පිළිබඳව කරුණු අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද නිලධර කමිටුවේ 2013.05.29 දිනැති වාර්තාව මගින් නිර්දේශිත පරිදි, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව නිකුත් කළ 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 හා එයට සිදු කළ සංශෝධන වෙනුවට පහත සඳහන් විධිවිධාන අදාළ විය යුතු බව, 2013.06.20 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02. රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට විවෘත, සීමිත හා කුසලතා පදනම මත 2007.07.01 දින සිට බඳවා ගනු ලැබූ සහ ඉදිරියේ දී බඳවා ගනු ලබන සියලුම නිලධරයන්, සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් එකී තනතුරට අදාළව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05ක් තුළ, පහත සඳහන් ව්‍යතිරේකවලට යටත්ව, ලබා ගත යුතු ය.

I. සීමිත හා කුසලතා පදනම මත 2007.07.01 දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007(II) නිකුත් කරන ලද 2011.07.13 දින දක්වා කාලය තුළ බඳවාගත් නිලධරයන් 2011.07.13 දින සිට වසර පහ (05)ක් ඇතුළත, තමන් නව පත්වීම් ලැබූ ඉහළ තනතුරට නියමිත භාෂා ප්‍රවීණතා මට්ටම අත් කර ගත යුතු වේ.

II. 2007.07.01 දින සිට 2010.06.30 දින දක්වා විවෘත පදනම මත රාජ්‍ය සේවයට බඳවා ගනු ලැබූ/පත්කරනු ලැබූ නිලධරයන්ට නියමිත භාෂා ප්‍රවීණතා මට්ටම අත් කර ගැනීම සඳහා ඔවුන්ගේ පත්වීම් දින සිට ලබා දී ඇති වසර පහ(05)ක කාල සීමාවට අතිරේක වශයෙන් තවත් වසර දෙක(02)ක සහන කාල පරිච්ඡේදයක් ලබා දෙන අතර එම කාලය ඇතුළත නියමිත භාෂා ප්‍රවීණතා මට්ටම අත් කර ගත යුතු වේ.

03. තනතුරුවලට පැවරෙන කාර්යභාරය අනුව අවශ්‍ය වන අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම පහත සඳහන් පරිදි කාණ්ඩ හතර(04)කින් සමන්විත වේ.

I. **1 වන කාණ්ඩය**

(අ) මෙම කාණ්ඩය සඳහා වූ ප්‍රවීණතා මට්ටමට අදාළව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණය හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණය සමත්විය යුතු වේ.

(ආ) එමෙන්ම අ.පො.ස. (සා.පෙළ) දෙවන බස සිංහල/දෙමළ විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා තිබීම, ලිඛිත පරීක්ෂණය සමත්වීම වෙනුවට විකල්ප සුදුසුකමකි.

(ඇ) නිලධරයා සේවයට බැඳුණු රාජ්‍ය භාෂාව නොවන අනෙක් රාජ්‍ය භාෂාව පරිපාලන භාෂාව වශයෙන් භාවිත කරනු ලබන ජනතාව බහුතරයක් වාසය කරන මෙම චක්‍රලේඛයේ කාර්යයන් සඳහා පමණක් අදාළ කර ගත යුතු, ඇමුණුම 02හි සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක තිබෙන රාජ්‍ය ආයතනයක එක් වර්ෂයක් හෝ එයට වැඩි කාලයක් හෝ සක්‍රීයව සේවය කිරීම ඉහත සඳහන් වාචික පරීක්ෂණය සමත් වීම වෙනුවට විකල්ප සුදුසුකමකි.

## II 2වන කාණ්ඩය

මෙම කාණ්ඩයේ ප්‍රවීණතා මට්ටමට අදාළව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණය හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණය සමත් විය යුතු වේ.

## III 3වන කාණ්ඩය

(අ) මෙම කාණ්ඩයේ ප්‍රවීණතා මට්ටමට අදාළව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණය හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණය සමත් විය යුතු වේ.

නැතහොත්

(ආ) තමන් සේවයට බැඳුණු අවස්ථාවේ දී බලපැවැත්වුනු සේවා ව්‍යවස්ථාවේ/බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන ප්‍රකාරව අදාළ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමේ අවශ්‍යතාව සපුරා තිබිය යුතු වේ.

නැතහොත්

(ඇ) සේවාරම්භක පුහුණුවේ කොටසක් වශයෙන් 3වන කාණ්ඩය සඳහා නියම කර ඇති විෂය නිර්දේශයට අනුකූල වන පරිදි අවම වශයෙන් පැය 150ක කාලයක් සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව/ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය විසින් හෝ එකී ආයතනයක අධීක්ෂණය යටතේ හෝ පවත්වනු ලබන සිංහල/දෙමළ භාෂාව පිළිබඳ පාඨමාලාවක් හදාරා එය අවසානයේ දී පැවැත්වෙන ලිඛිත හා වාචික පරීක්ෂණයන්ගෙන් සමත් විය යුතු වේ.

## IV 4වන කාණ්ඩය

(අ) මෙම කාණ්ඩයේ ප්‍රවීණතා මට්ටමට අදාළව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණය හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණය සමත් විය යුතු වේ.

නැතහොත්

(ආ) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හෝ පළාත් සභාවක් විසින් පාලනය කරනු ලබන පුහුණු ආයතනයක් විසින් හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මඟපෙන්වීම යටතේ අවම වශයෙන් පැය 100ක කාලයක් තුළ 4වන කාණ්ඩය සඳහා නියම කර ඇති විෂය නිර්දේශයට අනුකූලව පවත්වනු ලබන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පිළිබඳ පාඨමාලාවකට සහභාගීවීමෙන් අනතුරුව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මඟපෙන්වීම මත පවත්වනු ලබන ලිඛිත හා වාචික පරීක්ෂණයෙන් සමත් විය යුතු වේ.

04. ඉහත 1 වන කාණ්ඩයට අදාළ කරගනු ලබන විකල්ප සුදුසුකම් සපුරා ගැනීම තුළින් අනෙක් කාණ්ඩයන් සඳහා අදාළ වන්නා වූ භාෂා ප්‍රවීණතාවන් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවලින් නිදහස් වීමට ද හැකියාව ඇත.

05. ඉහත සඳහන් කාණ්ඩවලට අයත් සේවාවන් ඇමුණුම 01හි දක්වා ඇත. භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු බවට අලුතින් හඳුනා ගත් ආයුර්වේද වෛද්‍ය සේවයට හා ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගනු ලබන නිලධරයන්ට ද 2007.07.01 දින සිට මෙම විධිවිධාන අදාළ කර ගත යුතු අතර ඔවුනට මෙම චක්‍රලේඛය බලාත්මක වන දිනයේ සිට භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම සඳහා වසර 05ක සහන කාලයක් හිමි වනු ඇත.

06. නියමිත කාලය තුළ භාෂා ප්‍රවීණතාව අත් කර නොගන්නා නිලධරයන්ගේ එකී නියමිත කාලය අවසන් වූ වහාම ගෙවීමට නියමිත වැටුප් වර්ධක අදාළ සුදුසුකම් ලබාගන්නා තෙක් නතර කරනු ලැබේ.

07. ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් රාජ්‍ය සේවයට බැඳෙන නිලධරයන් පහත සඳහන් පරිදි රාජ්‍ය භාෂාවන්හි ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

I. එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාව මව්බස මට්ටමෙන් හා අනෙක් රාජ්‍ය භාෂාවේ ප්‍රවීණතාව දෙවන බස මට්ටමෙන් ලබාගත යුතු වේ.

II. තමන් මව්බස මට්ටමෙන් ප්‍රවීණතාව ලබා ගන්නේ කුමන රාජ්‍ය භාෂාවෙන් ද යන්න නිලධරයාගේ මනාපය පරිදි තීරණය කළ හැකි ය. මව්බස මට්ටමේ ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතු අතර, දෙවන බස මට්ටමේ ප්‍රවීණතාව සේවයට බැඳී අවුරුදු පහ(05)ක් තුළ ලබා ගත යුතු වේ.

III. ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයෙකු විසින් තමන් සේවයට ඇතුළත් වීමට පෙර හෝ සේවය අතරතුර දී හෝ අ.පො.ස. (සා.පෙළ) සිංහල/දෙමළ භාෂාව හා සාහිත්‍යය විෂය සමත් වී ඇත්නම්, එම රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් මව්බස මට්ටමේ ප්‍රවීණතාව ලබා ගැනීමේ අවශ්‍යතාව නිලධරයා විසින් සම්පූර්ණ කර ඇති බවට සැලකිය හැකි ය.

IV. ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයෙකුට දෙවන බස ප්‍රවීණතා මට්ටම ලබා ගැනීම සඳහා 04 ඡේදයේ විධිවිධාන ද අදාළ කර ගත හැකි ය.

08. ඉහත 03 ඡේදයේ කාණ්ඩවලට අදාළව පැවැත්වෙන ලිඛිත පරීක්ෂණ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුව විසින් ද, වාචික පරීක්ෂණ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් ද වසරකට දෙවතාවක් බැගින් 2014 වර්ෂයේ සිට සෑම වසරකම පැවැත්විය යුතු ය.

09. 2013.06.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් විද්වත් කමිටුව විසින් යෝජිත විෂය නිර්දේශ පදනම් කර ගෙන එක් එක් කාණ්ඩය සඳහා පෙළපොත් සම්පාදනය කිරීම හා ඒ අනුව ප්‍රවීණතා මට්ටම සඳහා ගැලපෙන පුහුණු මොඩියුල සම්පාදනය කිරීම මෙන්ම එම පුහුණු මොඩියුල අන්තර් ක්‍රියාකාරී ලෙස සංයුක්ත තැටි වශයෙන් සකස් කිරීම සහ එම රාජ්‍ය භාෂා පාඨමාලා මොඩියුල විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රචාරය කිරීමට ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් පියවර ගත යුතු ය.

10. ඉහත 09 ඡේදයේ සඳහන් මොඩියුල සකස් කරන තෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගැනීමට වඩාත් යෝග්‍ය පොත් හඳුනා ගැනීමටත්, එම පොත්වල පරිලෝකනය (Scan) කරන ලද PDF පිටපත් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙහි නිල වෙබ් අඩවියට ඇතුලත් කිරීමටත් සහ එම පොත්වල ප්‍රමාණවත් පිටපත් සංඛ්‍යාවක් මුද්‍රණය කොට ඒවා අවශ්‍ය කරනු ලබන රාජ්‍ය නිලධරයන්ට ලබා ගැනීමට හැකි ක්‍රමවේදයක් හඳුන්වාදීමටත් රාජ්‍ය භාෂා කොමසාරිස්වරයා විසින් අවශ්‍ය පියවර ගත යුතු ය.

11. අදාළ මට්ටම්වලට අයත් කාණ්ඩ සඳහා වූ විෂය නිර්දේශ අනුව ඒ ඒ කාණ්ඩවල ප්‍රවීණතා මට්ටමට සරිලන සේ පිළියෙල කරනු ලැබූ ආදර්ශ ප්‍රශ්න පත්‍ර කට්ටල විභාග දෙපාර්තමේන්තුව හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව එක්ව පිළියෙල කොට රාජ්‍ය නිලධරයන්ගේ පරිශීලනය සඳහා ලබාදීමට පියවර ගත යුතු ය.

12. ඉහත 03 ඡේදයේ සඳහන් කාණ්ඩවලින් 04වන මට්ටමට වඩා ඉහළ ප්‍රවීණතාවක් අවශ්‍ය වන කාණ්ඩවලට අයත් නිලධරයන්, අදාළ සේවාවලට/තනතුරුවලට බඳවා ගැනීම පිණිස තෝරා ගැනීමෙන් අනතුරුව ලබාදෙන සේවාරම්භක පුහුණුවේ කොටසක් වශයෙන් තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගැනීම සඳහා (ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයන් අදාළ වන පරිදි රාජ්‍ය භාෂා දෙකෙන් එක් භාෂාවක ප්‍රවීණතාව ලබා ගත යුතු ය.) ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ පහත සඳහන් පරිදි කඩිනම් භාෂා පුහුණු පාඨමාලාවක් ඇතුළත් කිරීමට අදාළ පත් කිරීම් බලධරයන් නොපමාව පියවර ගත යුතු ය.

I. එම පාඨමාලාවේ කාලය අවම වශයෙන් මෙම චක්‍රලේඛයේ 3වන කාණ්ඩයේ ප්‍රවීණතාව අත් කර ගැනීම සඳහා අවශ්‍ය යැයි සඳහන් කර ඇති පැය 150ක කාලයක් වීම.

II. පාඨමාලාව අවසානයේ පැවැත්වෙන ලිඛිත හා වාචික පරීක්ෂණයෙන් සමත්වීම 3වන කාණ්ඩයේ ප්‍රවීණතා මට්ටම සඳහා විකල්ප සුදුසුකමක් සේ සලකා කටයුතු කිරීම.

III. පත්වීම්ලාභීන් නව සේවා ස්ථානයන්ට අනුයුක්ත කිරීමට පෙර විධිමත් සේවාරම්භක පුහුණුවක් දැනට නොපැවැත්වෙන සේවාවන්/තනතුරු සඳහා හුදෙක් භාෂා ප්‍රවීණතාව ලබාදීම පිණිස පමණක් හෝ පුහුණු පාඨමාලාවක් අනිවාර්යයෙන් පැවැත්වීම.

13. කිසියම් තනතුරකට හෝ සේවාවකට අයත් නිලධරයන් මෙම චක්‍රලේඛයේ ඇමුණුම 1හි සඳහන් වර්ගීකරණයට ඇතුළත් නොවන්නේ නම් එම නිලධරයන් විසින් ලබා ගත යුතු අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම ඇතුළු රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පිළිබඳව වරින් වර පැන නඟින ගැටලු පිළිබඳව පරීක්ෂා කර බලා ඒ සම්බන්ධයෙන් වඩාත් සුදුසු තීරණ ගැනීම පිණිස පහත සඳහන් නිලධරයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරනු ලැබේ.

I. ආයතන අධ්‍යක්ෂ ජනරාල් (සභාපති)

II. රාජ්‍ය භාෂා කොමසාරිස්

III. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධරයෙකු

V. නියෝජනයන් සලකා බලන අවස්ථාවල දී අදාළ සේවාවෙහි/තනතුරෙහි පරිපාලන බලධරයා හෝ ඔහු/ඇය විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධරයෙකු

14. තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාවේ වාචික ප්‍රවීණතාව ලබා ගැනීමට සියලුම රාජ්‍ය නිලධරයන්ට අවස්ථාවක් ලබා දීම සඳහා ඇමුණුම 02හි සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක තිබෙන රජයේ ආයතනයක යටත් පිරිසෙයින් එක් අවුරුද්දක කාලයක් සක්‍රියව සේවය කිරීමට අවස්ථාව සැලසෙන පරිදි මුල් පත්වීමේ දී සේවා ස්ථානවලට අනුයුක්ත කිරීම සහ සුදුසු ස්ථාන මාරු ප්‍රතිපත්ති සකස් කිරීමට සියලුම පත් කිරීම් බලධරයන් පියවර ගත යුතු ය.

15. අවශ්‍ය රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම අගය කිරීමක් වශයෙන් නිලධරයන් විදේශ ශිෂ්‍යත්ව, පුහුණු පාඨමාලා හෝ පශ්චාත් උපාධි සඳහා ඉල්ලුම් කරන විට, එකී රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාව ලබා තිබෙන නිලධරයන්ට ප්‍රමුඛතාව ලබාදීමට පියවර ගත යුතු ය. දැනට ක්‍රියාත්මක අංක 03/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ද සැලකිල්ලට ගනිමින්, තමන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛය මඟින් නියම කර ඇති ප්‍රවීණතාවට වඩා ඉහළ ප්‍රවීණතාවක් ලබා ගැනීම සඳහා රජයේ නිලධරයන් උනන්දු කරවීම පිණිස සුදුසු දිරිගැන්වීමේ ක්‍රමයක් හඳුන්වා දීමට ඉදිරියේ දී පියවර ගනු ඇත.

16. රාජ්‍ය සේවයට අදාළ කරනු ලබන ඉහත සඳහන් භාෂා ප්‍රවීණතාව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, රජය සතු බැංකු හා සම්පූර්ණයෙන් රජයට අයත් සමාගම්වල තනතුරු සඳහා ද මෙම චක්‍රලේඛය බලාත්මක වන දින හෝ ඊට පසුව සේවයට බැඳෙන නිලධරයන්ට අදාළ වන බව දැක්වෙන චක්‍රලේඛයක් නිකුත් කිරීමට මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පියවර ගැනෙනු ඇත.

17. සියලුම බඳවා ගැනීමේ පරිපාටි හා සේවා ව්‍යවස්ථාවන්හි සඳහන් අනෙක් රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් වූ විධිවිධාන මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුව සංශෝධනය වූවා සේ සලකා කටයුතු කළ යුතු ය.

18. මෙම චක්‍රලේඛය අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය මත නිකුත් කෙරේ.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

| | සේවාවන්/ තනතුරු | ලබාගත යුතු ප්‍රවීණතා මට්ටම | | | |
|---|---|---|---|---|---|
| | | 1 කාණ්ඩය | 2 කාණ්ඩය | 3 කාණ්ඩය | 4 කාණ්ඩය |
| 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | ✓ | | | |
| 02 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | ✓ | | | |
| 03 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | ✓ | | | |
| 04 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | ✓ | | | |
| 05 | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | ✓ | | | |
| 06 | දේශීය ආදායම් සේවය | ✓ | | | |
| 07 | ශ්‍රී ලංකා තක්සේරු සේවය | ✓ | | | |
| 08 | ශ්‍රී ලංකා විගණන සේවය | ✓ | | | |
| 09 | අධිකරණ නිලධරයන් | ✓ | | | |
| 10 | ශ්‍රී ලංකා පොලිස් සේවයේ සහකාර පොලිස් අධිකාරී සහ ඊට ඉහළ ශ්‍රේණි | ✓ | | | |
| 11 | නීති නිලධරයන් | ✓ | | | |
| 12 | ශ්‍රී ලංකා විදේශ සේවය | ✓ | | | |
| 13 | ශ්‍රී ලංකා රේගු සේවය | ✓ | | | |
| 14 | දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන ඒ හා සමාන දෙපාර්තමේන්තුගත සේවාවලට අයත් නිලධරයන් | ✓ | | | |
| 15 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය | ✓ | | | |
| 16 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | ✓ | | | |
| 17 | විදුහල්පති සේවය | ✓ | | | |
| 18 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය හා ඒ හා සමාන දෙපාර්තමේන්තුගත සේවාවන් | | ✓ | | |
| 19 | පොලිස් සේවයේ සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ තනතුරු දරන නිලධරයන් | | ✓ | | |
| 20 | ග්‍රාම නිලධාරී | | ✓ | | |
| 21 | ව්‍යාප්ත සේවාවල නියුතු සියලුම ක්ෂේත්‍ර නිලධරයන් (තාක්ෂණ සේවාව වැනි සේවාවන්) | | ✓ | | |
| 22 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | | ✓ | | |
| 23 | පිළිගැනීමේ නිලධාරී | | ✓ | | |
| 24 | ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවය | | ✓ | | |
| 25 | පුස්තකාලයාධිපති සේවය | | ✓ | | |

| | සේවාවන්/ තනතුරු | ලබාගත යුතු ප්‍රවීණතා මට්ටම | | | |
|---|---|---|---|---|---|
| | | 1 කාණ්ඩය | 2 කාණ්ඩය | 3කාණ්ඩය | 4කාණ්ඩය |
| 26 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | | | ✓ | |
| 27 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | | | ✓ | |
| 28 | රජයේ වෛද්‍ය නිලධරයන් හා දන්ත වෛද්‍ය නිලධරයන් | | | ✓ | |
| 29 | ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | | | ✓ | |
| 30 | හෙද සේවය | | | ✓ | |
| 31 | පවුල් සෞඛ්‍ය සේවය | | | ✓ | |
| 32 | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | | | ✓ | |
| 33 | ශ්‍රී ලංකා ගුරු සේවය | | | ✓ | |
| 34 | පරිපූරක වෛද්‍ය වෘත්තිකයන්ගේ සේවාව හා අතුරු වෛද්‍ය සේවය | | | ✓ | |
| 35 | ප්‍රාථමික මට්ටමට අයත් නිලධරයන් | | | | ✓ |

**සිංහල භාෂාව පරිපාලන භාෂාව වශයෙන් භාවිත කරනු ලබන ජනතාව බහුතරයක් වාසය කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස**

**කොළඹ දිස්ත්‍රික්කය**

1 කඩුවෙල
2 හෝමාගම
3 පාදුක්ක
4 මහරගම
5 මොරටුව
6 කැස්බෑව

**ගම්පහ දිස්ත්‍රික්කය**

7 කටාන
8 දිවුලපිටිය
9 මීරිගම
10 මීනුවන්ගොඩ
11 ජා - ඇල
12 ගම්පහ
13 වැකේ (දොම්පේ)
14 මහර
15 බියගම

**කලුතර දිස්ත්‍රික්කය**

16 හොරණ
17 ඉංගිරිය
18 මදුරාවල
19 මිල්ලනිය
20 කලුතර
21 අගලවත්ත
22 පාලින්ද නුවර
23 වලල්ලාවිට

**මහනුවර දිස්ත්‍රික්කය**

24 තුම්පනේ
25 උඩදුම්බර
26 මිනිපේ
27 හතරලියද්ද
28 යටිනුවර
29 පාතහේවාහැට

**මාතලේ දිස්ත්‍රික්කය**

30 දඹුල්ල
31 නාඋල
32 පල්ලේපොල
33 ලග්ගල-පල්ලේගම
34 විල්ගමුව

**ගාල්ල දිස්ත්‍රික්කය**

35 බෙන්තොට
36 බලපිටිය
37 කරන්දෙණිය
38 ඇල්පිටිය
39 නියාගම
40 තවලම
41 නෙලුව
42 නාගොඩ
43 බද්දෙගම
44 වැලිවිටිය - දිවිතුර
45 අම්බලන්ගොඩ
46 ගෝනපීනුවල
47 හික්කඩුව
48 බෝපෙ - පෝද්දල
49 අක්මීමණ
50 යක්කලමුල්ල
51 ඉමදූව
52 හබරාදූව

**මාතර දිස්ත්‍රික්කය**

53 පිටබැද්දර
54 පස්ගොඩ
55 මුලටියන
56 අතුරලිය
57 අකුරැස්ස
58 මාලිම්බඩ
59 කඹුරුපිටිය
60 හක්මණ
61 කිරින්ද පුහුල්වැල්ල
62 තිහගොඩ
63 වැලිගම
64 මාතර කඩවත් සතර
65 දෙවිනුවර
66 දික්වැල්ල

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

67 සූරියවැව
68 ලුණුගම්වෙහෙර
69 තිස්සමහාරාමය
70 හම්බන්තොට
71 අම්බලන්තොට
72 අඟුණුකොළපැලැස්ස
73 වීරකැටිය
74 කටුවන
75 වළස්මුල්ල
76 ඕකෙවෙල
77 බෙලිඅත්ත
78 තංගල්ල

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

79 ගිරිබාව
80 ගල්ගමුව
81 ඇහැටුවැව
82 අඹන්පොළ
83 කොටවෙහෙර
84 නිකවැරටිය
85 මහව
86 පොල්පිතිගම
87 ඉබ්බාගමුව
88 ගණේවත්ත
89 වාරියපොළ
90 බිංගිරිය
91 පඬුවස්නුවර නැගෙනහිර
92 බමුණාකොටුව
93 මාස්පොත
94 වීරඹුගෙදර
95 කුලියාපිටිය බටහිර
96 පන්නල
97 නාරම්මල
98 අලව්ව

**පුත්තලම දිස්ත්‍රික්කය**

99 කරුවලගස්වැව
100 නවගත්තේගම
101 මහකුඹුක්කඩවල
102 ආණමඩුව
103 ආරච්චිකට්ටුව
104 මාදම්පේ
105 මහවැව
106 වෙන්නප්පුව
107 දන්කොටුව

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

108 පදවිය
109 කැබිතිගොල්ලෑව
110 මැදවච්චිය
111 මහවිලච්චිය
112 නුවරගම් පළාත - මධ්‍යම
113 ගලෙන්බිදුණුවැව
114 මිහින්තලේ
115 නුවරගම් පළාත - නැගෙනහිර
116 නොච්චියාගම
117 රාජාංගනය
118 තඹුත්තේගම
119 තලාව
120 තිරප්පනේ
121 පලුගස්වැව
122 ගල්නෑව

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

123 හිඟුරක්ගොඩ
124 මැදිරිගිරිය
125 දිඹුලාගල
126 ඇළහැර

**බදුල්ල දිස්ත්‍රික්කය**

127 මහියංගනය
128 රිදීමාලියද්ද
129 මීහගහකිවුල
130 කන්දකැටිය

**මොණරාගල දිස්ත්‍රික්කය**

131 බිබිල
132 මඩුල්ල
133 සියඹලාණ්ඩුව
134 වැල්ලවාය
135 බුත්තල
136 කතරගම
137 තණමල්විල
138 සෙවණගල

**රත්නපුර දිස්ත්‍රික්කය**

139 ඇහැලියගොඩ
140 කුරුවිට
141 කිරිඇල්ල
142 ඕපනායක
143 ඇලපාත
144 වැලිගෙපොල
145 ඇඹිලිපිටිය
146 කොලොන්න

**කෑගල්ල දිස්ත්‍රික්කය**

147 රඹුක්කන
148 අරණායක
149 කෑගල්ල
150 ගලිගමුව
151 වරකාපොළ

**වව්නියා දිස්ත්‍රික්කය**

152 වවුනියා දකුණ

**මුලතිව් දිස්ත්‍රික්කය**

153 වැලිඔය

**අම්පාර දිස්ත්‍රික්කය**

154 දෙහිඅත්තකණ්ඩිය
155 පදියතලාව
156 මහඔය
157 උහන
158 අම්පාර
159 දමන
160 ලාහුගල

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

161 පදවි ශ්‍රී පුර
162 ගෝමරන්කඩවල

**දෙමළ භාෂාව පරිපාලන භාෂාව වශයෙන් භාවිත කරනු ලබන ජනතාව බහුතරයක් වාසය කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස**

**යාපනය දිස්ත්‍රික්කය**

1 කයිට්ස්
2 කරෙයිනගර්
3 වලිකාමම් බටහිර (වංකානෙයි)
4 වලිකාමම් නිරිත (සන්දිලිපායි)
5 වලිකාමම් උතුර
6 වලිකාමම් දකුණ (උඩුවිල්)
7 වලිකාමම් නැගෙනහිර (කෝපායි)
8 වඩමාරච්චි නිරිත (කරවෙඩ්ඩි)
9 මරුතන්කනී (වඩමාරච්චි නැගෙනහිර)
10 වඩමාරච්චි උතුර (පේද්‍රුරු තුඩුව)
11 තෙන්මාරච්චි (චාවකච්චේරි)
12 නල්ලූර්
13 යාපනය
14 වේලනෙයි
15 ඩෙල්ෆ්

**මන්නාරම දිස්ත්‍රික්කය**

16 මන්නාරම් නගරය
17 මාන්තයි බටහිර
18 මඩු
19 නානාට්ටාන්
20 මුසලි

**වව්නියා දිස්ත්‍රික්කය**

21 වවුනියා උතුරු
22 වවුනියා
23 වෙංගලචෙට්ටිකුලම්

**මුලතිව් දිස්ත්‍රික්කය**

24 දූනුක්කායි
25 මන්තායි නැගෙනහිර
26 පුදුකුඩිඉරිප්පු
27 ඔඩ්ඩුසුඩාන්
28 මැරිටයිම්පත්තු (මුහුදුබඩු පත්තු)

**කිලිනොච්චි දිස්ත්‍රික්කය**

29 පච්චිලෙයිපල්ලි
30 කන්දවලායි
31 කරච්චි
32 පූනාකරි

**මඩකලපුව දිස්ත්‍රික්කය**

33 කෝරලේ පත්තු උතුර (වාහරෙයි)
34 කෝරලේ පත්තු මධ්‍යම
35 කෝරලේ පත්තු බටහිර (ඔඩ්ඩමාවඩි)
36 කෝරලේ පත්තු (වාලච්චේන)
37 කෝරලේ පත්තු දකුණ (කිරාන්)
38 ඉරාවූර් පත්තු
39 ඉරාවූර් නගරය
40 මන්මුනේ උතුර
41 මන්මුනේ බටහිර
42 මන්මුනේ පත්තු (ආරයිමතී)
43 මන්මුනේ නිරිත
44 පෝරතිව්පත්තු
45 මන්මුනේ දකුණ සහ එරුවිල් පත්තු

**අම්පාර දිස්ත්‍රික්කය**

46 නාවින්දවේලි
47 සමන්තුරෙයි
48 කල්මුණේ දමිළ
49 කල්මුනේ
50 සයින්දමරදු
51 කාරතිව්
52 නින්දවූර්
53 අඩ්ඩාලච්චේන
54 ඉරක්කාමම්
55 අක්කරෙයිපත්තු
56 අලයාඩිවෙම්බු
57 තිරුක්කෝවිල්
58 පොතුවිල්

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

59 කුච්චවේලි
60 කින්නියා
61 මුතූර්
62 වෙරුගල් (ඊච්චිලම්පත්තු)